# දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

## තනතුරු පුරප්පාඩු

**(බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවය)**

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (දෙහිවල ගල්කිස්ස මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

**01. පෙර පාසල් ගුරු - (III ශ්‍රේණිය)**

(බඳවා ගැනීම් පරිපාටිය - 2017.10.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 04

වැටුප් පරිමාණය - MN-1-2016 (රා. ප. ච. 3/2016 අනුව)
රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 21,532/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ) i. අධ්‍යාපන සුදුසුකම් (විවෘත අයදුම්කරුවන් සඳහා)*

- භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.
  *සහ*
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

ii. අධ්‍යාපන සුදුසුකම් (සීමිත අයදුම්කරුවන් සඳහා)

- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් හයකින් (06) සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

*(ආ) වෘත්තීය සුදුසුකම් (විවෘත / සීමිත අයදුම්කරුවන් සඳහා)*

- පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

  (බස්නාහිර පළාත් පෙරපාසල් ප්‍රඥප්තියට අනුව සලකා බලන පාඨමාලා කාලය වසරක් වන බැවින්, වසරක හෝ ඊට වැඩි පාඨමාලාවන් හදාරා ඇති අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

*(ඇ) පළපුරුද්ද (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි)*

- අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිඳු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(ඇ) වෙනත් සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා) :

- වයස : (විවෘත අයදුම්කරුවන් සඳහා)
  අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
  (සීමිත අයදුම්කරුවන් සඳහා)
  දැනටමත් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ.

- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(ඇ) ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (විවෘත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (සීමිත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

***සටහන*** : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලබන අතර ආයතනික අවශ්‍යතාවය මත වයසින් අඩු හා මනා පෞරුෂයක් සහිත අයදුම්කාරියන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

***සැ. යු.*** : සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

**02. සෞඛ්‍ය පරිපාලක - ( III ශ්‍රේණිය)**

(බඳවා ගැනීම් පරිපාටිය - 2014.02.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පරිපාලක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 03

වැටුප් පරිමාණය - MN-1-2016 (රා. ප. ච. 3/2016 අනුව)
රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව ආරම්භක වැටුප රු. 21,532/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) i. අධ්‍යාපන සුදුසුකම් (විවෘත අයදුම්කරුවන් සඳහා)

- භාෂාව (සිංහල / දෙමළ / ඉංග්‍රීසි), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

ii. අධ්‍යාපන සුදුසුකම් (සීමිත අයදුම්කරුවන් සඳහා)

- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

(ආ) පළපුරුද්ද (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි)

- පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05)ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතුය.

(ඇ) වෙනත් සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා)

- වයස : (විවෘත අයදුම්කරුවන් සඳහා)
  අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

  (සීමිත අයදුම්කරුවන් සඳහා)
  දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ.

- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iiii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ඈ) ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (විවෘත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

***සටහන*** : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබා ගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණයේ සංයුතිය (සීමිත අයදුම්කරුවන් සඳහා)

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය | 100 | 40% |

***සටහන*** : ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

(ඉ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි.)

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | 25 |
| වැඩ බැලීම හෝ රාජකාරී ඉටු කිරීම | 10 | |
| ක්ෂේත්‍රයට අදාලව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන*** .- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බලනු ලැබේ.

**සැ. යු** .- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

03. රියදුරු III පන්තිය :

(*බඳවා ගැනීම් පරිපාටිය* .- 2016.02.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අත්සන් කරන ලද 2013.07.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා වන ඒකාබද්ධ රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය)

පුරප්පාඩු ගණන - 08

වැටුප් පරිමාණය - PL-3-2016
රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,462/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ)* අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් භාෂාව (සිංහල/ දෙමළ) ඇතුළුව සම්මාන සාමාර්ථ 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් වී තිබිය යුතුය.)

*(ආ)* වෘත්තීය සුදුසුකම් :

(i) පෞද්ගලික/ කුළී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.

(බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් "සී" සහ "සී1" පන්තියේ වාහන බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)

*සංලක්ෂ්‍යය:-*
ආයතනයේ අවශ්‍යතාවය අනුව, බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය ඇති අවස්ථාවලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, "ඒ1" සහ "සී1" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" සහ "ඩී1" පන්තියේ බලපත්‍රයක් *නැතහොත්* තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබීම මූලික සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.

* ඉහත (ආ) යටතේ අදාළ සේවා ව්‍යවස්ථාවේ සඳහන්ව ඇති ආකාරයට සුදුසුකම් දක්වා ඇති නමුත්, ආයතනික වශයෙන් වැඩි අවශ්‍යතාවයක් පවතින්නේ ට්‍රැක්ටර්රථ පැදවීම සඳහා වන බැවින්,ඉහත සංලක්ෂය යටතේ සඳහන් සුදුසුකම ඇති අයවළුන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

(ii) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

*(ඇ)* පළපුරුද්ද

- බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)

*(ඈ)* කායික සුදුසුකම්

- අවම උස අඩි 05ක් විය යුතුය.
- දිවා කාලයේ සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදී සිටීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතුය.)

*(ඉ)* වෙනත් සුදුසුකම්

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන්ට මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.)
- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

වෘත්තීය පරීක්ෂණයකට හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

වෘත්තීය පරීක්ෂණයේ සංයුතිය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණත්වය | 40% | 20% |
| මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40% | 20% |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20% | 10% |

**04. බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු - ( 111 ශ්‍රේණිය)**

(වීල් ලෝඩර්, බැකෝ ලෝඩර්, වීල් එක්ස්කැවේටර්, මිනි එක්ස්කැවේටර්, රෝඩ් රෝලර්, ස්කිඩ් ස්ටියර් වැනි යන්ත්‍ර සඳහා)

( *බඳවා ගැනීම් පරිපාටිය* .- 2016.08.04 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු සහ ගල්රෝල් රියදුරු තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 08

වැටුප් පරිමාණය - PL-3-2016 (රා. පරි. ච. 3/2016 අනුව)
රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,462/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) *අධ්‍යාපන සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා) :*

- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් **සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.** (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

  (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 3 හෝ ඊට ඉහළ NVQ සුදුසුකම් මට්ටමක් ලබා තිබීම ඉහත අධ්‍යාපන සුදුසුකම සම්පූර්ණ කළා හා සමානව සලකනු ලැබේ.)

(ආ) *වෘත්තීය සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා) :*

- බර වාහන රියැදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.
- අවම උස අඩි 05ක් විය යුතුය.
- බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතිකපතක් තිබිය යුතුය.
- මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය.

(ඇ) *පළපුරුද්ද :*

*විවෘත අයදුම්කරුවන් සඳහා :*

- බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
  *(ලිඛිතව සනාථ කළ යුතුය.)*

*සීමිත අයදුම්කරුවන් සඳහා :*

- පළාත් පාලන ආයතනයක PL1 හෝ PL2 තනතුරක ස්ථිර කර තිබීම සහ එම තනතුරේ සේවා කාලය වසර 03 සම්පූර්ණ කර තිබිය යුතුය.
- බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා එම යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ මාස 06ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
  *(ලිඛිතව සනාථ කළ යුතුය.)*

(ඈ) *වෙනත් සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා)*

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.(දැනටමත් සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාවන් අදාළ නොවේ.)
- මෙම දැන්වීමෙහි පහතින් "**බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි**" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ඉ) *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.*

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය(සීමිත සහ විවෘත අයදුම්කරුවන් සඳහා)*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම | 30% | 50 % |
| යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම | 50% | |
| ප්‍රායෝගික පරීක්ෂණය | 15% | |
| පෞරුෂත්වය | 05% | |

**සටහන**:- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.

**සැ. යු.** : සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

*අර්ධ ශිල්පීය තනතුරු*

| | | |
|---|---|---|
| 05. | වාහන විදුලි කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 06. | ආදාහනාගාර ක්‍රියාකරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 07. | පෙදරේරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 06 |
| 08. | වඩු කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 09. | වෑද්දුම්කරු (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |
| 10. | ඩීසල් කාර්මික (III ශ්‍රේණිය) | පුරප්පාඩු ගණන - 01 |

(බඳවා ගැනීම් පරිපාටිය - 2016.09.28 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

වැටුප් පරිමාණය - PL-2-2016 (රා. පරි. ච. 3/2016 අනුව)
25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 20,034/-)

(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ) අධ්‍යාපන සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා) :*

- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් **සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.** (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

  (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2016 අනුව තනතුරට අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තිය සුදුසුකම් ( NVQ) 3 හෝ ඊට ඉහළ NVQ සුදුසුකම් මට්ටමක් ලබා තිබීම ඉහත අධ්‍යාපන සුදුසුකම සම්පූර්ණ කළා හා සමානව සලකනු ලැබේ.)

*(ආ) වෘත්තීය සුදුසුකම් (විවෘත අයදුම්කරුවන් සඳහා) :*

- අදාළ තනතුරට නියමිත පරිදි, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හී (**N.V.Q.**) අවම වශයෙන් **දෙවන මට්ටමේ** නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාළ **ක්ෂේත්‍රයේ මාස 06කට** නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.
  (සහතික මගින් සනාථ කළ යුතුය)

*(ඇ) වෘත්තීය සුදුසුකම් (සීමිත අයදුම්කරුවන් සඳහා) :*

- අදාළ තනතුරට නියමිත පරිදි, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හී (N.V.Q. ) අවම වශයෙන් **දෙවන මට්ටමේ** නිපුණතාවයක් ලබා ගෙන තිබීම හෝ අවම වශයෙන් අදාළ **ක්ෂේත්‍රයේ මාස 06කට** නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.
  (සහතික මගින් සනාථ කළ යුතුය)

*(ඈ) පළපුරුද්ද (සීමිත අයදුම්කරුවන් සඳහා පමණි) :*

- අදාළ පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති, **සේවා කාලය වසර 05ක්** සපුරා ඇති හා අදාළ **කාර්යක්ෂමතා කඩඉම සමත්,** වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයෙකු විය යුතුය.

(ඉ) වෙනත් සුදුසුකම් (සීමිත හා විවෘත අයදුම්කරුවන් සඳහා) :

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම වයස් සීමාව අදාල නොවේ.)
- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ඊ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය (සීමිත අයදුම්කරුවන් සඳහා) :

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස.(සා.පෙළ) විභාග යේ දී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා, ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02)ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>✓ සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>✓ සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>✓ අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>✓ විශිෂ්ඨ සාමාර්ථයට - ලකුණු 10 | 20% | 50 % |
| තනතුරට අදාළ ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණය<br>බඳවා ගන්නා තනතුරට අදාළව පෙර සූදානම, යන්ත්‍ර ක්‍රියාකාරීත්වය, යන්ත්‍රය හැසිරවීම, පාලනය, නඩත්තුව, අළුත්වැඩියාව, අමතර කොටස්, ඉන්ධන යෙදීම, උපකරණ භාවිතය, අමුද්‍රව්‍ය සකස් කර ගැනීම, ආරක්ෂක උපකරණ, ආරක්ෂක උපක්‍රම ආදිය පිළිබඳව ඇති දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රායෝගික පරීක්ෂණයකි. | 75% | |
| පෞරුෂත්වය(අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු) | 05% | |

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය(විවෘත අයදුම්කරුවන් සඳහා)

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස.(සා.පෙළ) විභාග යේ දී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා, ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02)ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>✓ සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>✓ සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>✓ අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>✓ විශිෂ්ඨ සාමාර්ථයට - ලකුණු 10 | 20% | 50% |
| සාමාන්‍ය දැනීම<br>ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය සහ විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. | 75% | |
| පෞරුෂත්වය(අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු) | 05% | |

**සටහන:-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම ද මෙහිදී සිදු කෙරේ.

**සැ. යු. :** සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී පමණක් විවෘත අයදුම්කරුවන් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

**11. කාර්යාල කාර්ය සහායක - ( III ශ්‍රේණිය)**

(බඳවා ගැනීම් පරිපාටිය - 2015.10.15 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අත්සන් කරන ලද 2012.01.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ කාර්යාල සේවක සේවයේ තනතුරු සඳහා වන ව්‍යවස්ථා සංග්‍රහය)

පුරප්පාඩු ගණන - 07

වැටුප් පරිමාණය - PL-1-2006A
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

(අ) බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05)ක් එකවර සමත් විය යුතුය.)
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20% | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75% | |
| පෞරුෂත්වය | 05% | |

**සටහන:-** පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

*ශිල්පීය නොවන තනතුරු*

12. ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය) පුරප්පාඩු ගණන - 05

(බඳවා ගැනීම් පරිපාටිය - 2016.11.15 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

වැටුප් පරිමාණය - PL-1-2016 (රා. පරි. ච. 3/2016 අනුව)
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

*(අ)* අධ්‍යාපන සුදුසුකම් :

- අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් විය යුතුය.)

*(ආ)* වෙනත් සුදුසුකම් :

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- මෙම දැන්වීමෙහි පහතින් "**බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි**" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*(ඇ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා, ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02)ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>✓ සාමාන්‍ය සාමාර්ථයට - ලකුණු 04<br>✓ සම්මාන සාමාර්ථයට - ලකුණු 06<br>✓ අධි සම්මාන සාමාර්ථයට - ලකුණු 08<br>✓ විශිෂ්ඨ සාමාර්ථයට - ලකුණු 10 | 20% | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75% | |
| පෞරුෂත්වය | 05% | |

**සටහන:-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීම ද මෙහිදී සිදු කෙරේ.

**13. වැඩ/ක්ෂේත්‍ර කම්කරු- (III ශ්‍රේණිය)**

(බඳවා ගැනීම් පරිපාටිය - 2015.03.03 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 31

වැටුප් පරිමාණය - PL-1-2016
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242/-)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*(අ)* බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- මෙම දැන්වීමෙහි පහතින් **"බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි"** යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*(ආ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට උපරිම ලකුණු 05 බැගින්) | 15% | 50 % |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05% | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75% | |
| පෞරුෂත්වය | 05% | |

***සටහන*** :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

<u>ආයතනික අවශ්‍යතාවය මත තනතුරට අදාළ ක්ෂේත්‍ර කාර්යයන් සම්බන්ධව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර එහිදී යෝග්‍යතාවය ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.</u>

තනතුරට අදාළ කාර්යයන් පහතින් දැක්වේ.

මාර්ගය දෙපස පිරිසිදු කිරීම,කාණු පිරිසිදු කිරීම,කාණු සැකසීම, ප්‍රිමික්ස් දැමීම, අනතුරුදායක ගස් අතු ඉවත් කිරීම, මාර්ග සැකසීම, ඍජු ශ්‍රමය යටතේ සිදු කරන කර්මාන්ත හා ඉදි කිරීම් සඳහා වැඩ පරිපාලක විසින් නියම කරනු ලබන කාර්යයන් ඉටු කිරීම, ආයතනික අවශ්‍යතාවය මත පවරනු ලබන තනතුරෙහි රැකියා විස්තරයට අදාළ වෙනත් රාජකාරි.

මෙම සියලු කාර්යයන් අසීරු සහ වෙහෙසකර කාර්යයන් වන හෙයින් පිරිමි අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

14. **සෞඛ්‍ය කම්කරු- (III ශ්‍රේණිය)**

(බඳවා ගැනීම් පරිපාටිය - 2014.09.23 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාතේ, පළාත් පාලන ආයතනවල ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන - 41

වැටුප් පරිමාණය - PL-1-2016
රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410/-
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 හි උපලේඛන අංක 11 අනුව ආරම්භක වැටුප රු. 19,242)
(හතරවන වැටුප් පියවරට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

*(අ) බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :*

- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- මෙම දැන්වීමෙහි පහතින් "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති i සිට iii දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*(ආ)* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සංයුතිය*

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට උපරිම ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

***සටහන .-*** පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සළකා බලනු ලැබේ.

<u>ආයතනික අවශ්‍යතාවය මත තනතුරට අදාළ ක්ෂේත්‍ර කාර්යයන් සම්බන්ධව ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර එහිදී යෝග්‍යතාවය ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.</u>

තනතුරට අදාළ කාර්යයන් පහතින් දැක්වේ.

කසළ ඉවත් කිරීමේ කාර්යයන්, පාරවල් අතුගෑම, වෙරළ තීර පවිත්‍ර කිරීම, මළ සතුන් වැලලීම,මදුරු මර්දන කටයුතුවලදී මදුරුවන් බෝ වන ස්ථාන ඉවත් කිරීම හා විනාශ කිරීම, සෞඛ්‍ය ගැටලු ඇති වන ආකාරයට කාණු පිරී ඇති අවස්ථාවල දී ඒවායේ අවහිරවීම් ඉවත් කිරීම, ඉහත කී කාර්යයන්ට අදාළ වෙනත් සහාය කාර්යයන්, ආයතනික අවශ්‍යතාවය මත පවරනු ලබන තනතුරෙහි ඡකියා විස්තරයට අදාළ වෙනත් රාජකාරි.

මෙම සියලු කාර්යයන් අසීරු සහ වෙහෙසකර කාර්යයන් වන හෙයින් පිරිමි අයදුම්කරුවන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

01. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතුය. (දෙහිවල ගල්කිස්ස බල ප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.)

iii. යහපත් චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iv. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළ පරීක්ෂණවල දී කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන්ද යන්න දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

v. කිසියම් අයදුම්කරුවෙකු බඳවා ගැනීමේ පරීක්ෂණයකට කැඳවූ පමණින් හෝ එම පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසලකනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

ii. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

iii. බඳවා ගනු ලබන තැනැත්තන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ.
(දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු පත්වීම ස්ථිර කරන ලද සේවකයින් වසර 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.)

iv. මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හා බස්නාහිර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

03. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

i. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘති අනුව, අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

ii. අයදුම්පත සමග, ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් "නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව" නමට ලබා ගන්නා ලද සහ ගෙවීමේ කාර්යාලය "දෙහිවල" ලෙස සඳහන් කරන ලද රු. 200ක සාමාන්‍ය මුදල් ඇණවුමක මුල් පිටපත අයදුම්පතෙහි අදාළ ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය.
(ඔබගේ අවශ්‍යතාවය සඳහා මුදල් ඇණවුමෙහි පිටපතක් ඔබ සතුව තබා ගැනීම සුදුසුය.)

iii. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබූ විට පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර "ආ" සිට "උ" දක්වා වන සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතුය.

*(අ)* ඔබගේ නම සහ ලිපිනය ලියන ලද 9" x 4"ප්‍රමාණයේ ලියුම් කවරයක්,

*(ආ)* උප්පැන්න සහතිකය,

*(ඇ)* අධ්‍යාපන සහතික හෝ ලබාගත් ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන වෙනත් සහතික,

*(ඈ)* වෘත්තීය සුදුසුකම් සනාථ කිරීමේ සහතික,

*(ඉ)* පළපුරුද්ද පිළිබඳ සහතික,

(ඊ) තනතුරට අදාළ වෙනත් සහතික ,

(උ) ජාතික හැඳුනුම්පතේ / රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායාස්ථිත පිටපත,

(ඌ) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය (මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 6කට නොඅඩු කාලයක් තුළ ලබාගත් එකක් විය යුතු අතර වසර 3ක ස්ථිර පදිංචිය සනාථ කිරීමේ දී අවිනිශ්චිතව ලබා දී ඇති සනාථ කිරීම් සළකා බලනු නොලැබේ. "උදාඃ- වසර 05ක සිට පදිංචිව සිටින බව පවසයි.")

(එ) තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයට අදාළ පොලිස් ස්ථානයෙන් ලබා ගත් පොලිස් වාර්තාවක්(මෙය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස 6කට නොඅඩු කාලයක් තුල ලබාගත් එකක් විය යුතුය.)

(ඒ) චරිත සහතිකයක්.

(iv) යම් අයදුම්කරුවෙකු තනතුරු එකකට වඩා වැඩි ගණනක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර පිළියෙල කර වෙන වෙනම කවරවල බහා ඉදිරිපත් කළ යුතුය.

(v) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2018.07.16 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(vi) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

(vii) තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුණු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) අදාළ බඳවා ගැනීම් පරිපාටිවලට අනුව මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් තෝරා ඔවුන් බඳවා ගැනීමේ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පතෙහි සාවද්‍ය තොරතුරු සඳහන් කර පරීක්ෂණ සඳහා සහභාගී වූ බවට අනාවරණය වුවහොත් එවැන්නන් අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරනු ලබන අතර එසේ වුවහොත් මින් ඉදිරියට මෙම සභාව සඳහා සිදු කරන කිසිදු සේවක බඳවා ගැනීමක් සඳහා අයදුම් කිරීමේ අවස්ථාව එවැනි අයදුම්කරුවන්ට අහිමි වනු ඇත.

අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීමේ හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලු කාරණා පිළිබඳ අවසාන තීරණය දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ධම්මික මුතුගල,
නාගරික කොමසාරිස්,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2018 ජුනි මස 22 වැනි දින.

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

### *පෙර පාසල් ගුරු තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. ජීව දත්ත තොරතුරු :

1.1. අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : (උදා - සිල්වා ඒ. බී. සී.)
: ..........................................................................................................................................

1.2. සම්පූර්ණ නම : ..........................................................................................................................................
